**සංචාරක අමාත්‍යාංශය**

# ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

## ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

## බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය II අදියර, 2 පියවර, ඇබෑර්තු (කොන්ත්‍රාත් පදනම මත)

කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ඉහත සඳහන් ව්‍යාපෘතියේ පහත සඳහන් ඇබෑර්තු සඳහා අයදුම්පත් මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019 ප්‍රකාරව සුදුසුකම්ලත්, කාර්යශූර, ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් කැඳවනු ලැබේ.

### 1. සිවිල් ඉංජිනේරු (PS 4 කාණ්ඩය ඒ) තනතුරු 01

**සුදුසුකම් (පහත i හෝ ii)**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලද සිවිල් ඉංජිනේරු විද්‍යා ප්‍රථම උපාධිය.

**හෝ**

සිවිල් ඉංජිනේරු විද්‍යා උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

**හෝ**

පිළිගත් වෘත්තීයවේදී සිවිල් ඉංජිනේරු ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ඒ හා සමාන වෘත්තීමය සුදුසුකමක්.

**සමග**

අවම වශයෙන් සිවිල් ඉංජිනේරු කටයුතු පිළිබඳ වසර 09 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

ii. සිවිල් ඉංජිනේරු කටයුතු සම්බන්ධයෙන් රජයේ දීප ව්‍යාප්ත සේවයේ iii/ii පංතිය හෝ ඉහළ / හෝ සමානතාවයේ නිලධාරියෙකු වීම.

**සහ**

අවම වශයෙන් වසර 09 ක ii/iii ශ්‍රේණියේ පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

MS Project /Primavera මගින් ව්‍යාපෘති සැලසුම්කරණ පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

වැටුප් : මට්ටම PS 4-රු. 155,000/-

### 2. ව්‍යාපෘති ලේකම් (PS 6 කාණ්ඩය ඒ) තනතුරු 01

**සුදුසුකම් (පහත i හෝ ii)**

I. ඉංග්‍රීසි හා සිංහල / දෙමළ භාෂාව යන විෂයන් ඇතුළුව සම්මාන සාමාර්ථ 03 සහිතව විෂයයන් 6 ක් සමග අ.පො.ස. (සා.පෙ) විභාගය සමත්ව තිබීම.

**සමග**

පිළිගත් ආයතනයකින් ලේකම් පාඨමාලාවක් හදාරා තිබීම හෝ වරලත් ලේකම් දක්වා දිවෙන පාඨමාලා හැදෑරීම

**සමග**

අවම වශයෙන් ලේකම්වරයකු වශයෙන් වසර 06 ක පළපුරුද්ද.

**හෝ**

ii. අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද සහිත වරලත් ලේකම්වරයකු වීම.

වැටුප් : මට්ටම PS 6-රු. 67,000/-

ඉහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය ප්‍රවීණතා හා සුදුසුකම්

i. වයස අවුරුදු 63 වඩා අඩු වීම.

ii. අනර්ඝ අන්තර් පුද්ගල සංනිවේදන හැකියාව (කථන / ලිඛිත) හා වාර්තා ලිවීමේ කුසලතා / හැකියාව.

iii. MS කාර්යාල පැකේජය (office Packages) දැනුම හා ඉතා උසස් මට්ටමේ පරිගණක සාක්ෂරතාවය.

iv. 1 වන තනතුර සඳහා AutoCAD and MS Project හෝ සමාන පැකේජයක නිපුණතාව

v. කණ්ඩායමක් සමග ස්වාධීනව වැඩකිරීමේ හැකියාව හා බහුවිධ කාර්යයන් හැසිරවීමේ හැකියාව.

vi. 2 වන තනතුර සඳහා අනර්ඝ මහජන සම්බන්ධතා සමග ආකර්ෂණීය පෞරුෂයන් සතු වීම අවශ්‍යවේ.

**සේවා නියුක්ති කොන්දේසි**

වසරක කාල පරිච්ඡේදය සඳහා කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලබන අතර, ව්‍යාපෘති කාලසීමාව තුළ සතුටුදායක කාර්යසාධනය මත වාර්ෂිකව නැවත අලුත් කරනු ලැබේ.

රැකියා ස්ථානය කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල වේ.

**අයදුම්පත්**

නියමිත ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඔබගේ අධ්‍යාපනික, වෘත්තීමය හා පළපුරුද්ද හා සම්බන්ධ සහතික පිටපත් හා ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනකුගේ නම් හා විමසුම් තොරතුරු සමග මෙම දැන්වීමේ දින සිට රජකාරී දින 10 ඇතුළත අයදුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස උඩු කෙළවරෙහි පැහැදිලිව සටහන් කොට පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ස්වයංව සහතික කරනලද සහතිකපත්වල පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය. රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය. පළපුරුද්ද හා සුදුසුකම් මත කෙටි ලැයිස්තුගත කරනලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**ලේකම්,**
**ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය,**
**30 වන මහල, බටහිර කුලුන,**
**ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.**